ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

----------------------------

සම්පූර්ණයෙන් ක්ෂය වු නමුත් දැනට භාවිතයට ගනු ලබන පිරිවැය රු.40,285,117ක්වූ වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18ට අනුව ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වු නියැදි පරීකෂණයේදි අනාවරණය වු එකතුව රු.9,423,670ක් වු ගිණුම්කරණ අඩුපාඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙ අධ්‍යකෂ වෙත 2011 මැයි 11 දිනැති කළමනාකරණ වාර්තාව මගින් යොමු කරන ලද අතර අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 23 දින විගණනයට ඉදිරිපත් කෙරුණි. 2009 වර්ෂයේ ලාභලාභ විසර්ජන ගිණුමේ අංක ගණිත දෝෂ සහ පිටපත් කිරීමේ දෝෂ අනාවරණය වු අතර රු.62,686,900ක් ලෙස දක්වා තිබු ලාභලාභ විසර්ජන ගිණුමේ ඍණ ශේෂය රු.73,940,864ක් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රු.44,904,308ක ඍණ ශේෂයක් ලෙස ඉදිරියට ගෙන විත් තිබුණ. එහෙත් ඊට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

1.2.3 **හඳුනා නොගත් වියදම්**

------------------------

සමාලෝචිත වර්ෂයේ රු.5,360,656ක්වු උපචිත වියදම් තුල 2006 වර්ෂයේ සිට ඉදිරියට එන හඳුනා නොගත් රු.690,668ක් වු ශේෂයක් හා වර්ගීකරණය නොකළ ජාත්‍යන්තර ශාඛාවේ උපචිත වියදම් රු.3,743,217ක් ද ඇතුලත් විය.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

අ) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වර්ෂ 5කට වැඩි කාලයක සිට අය නොවී පවතින විවිධ ණය ගැතියන්ගේ ශේෂ වල එකතුව රු.161,338ක් විය.

ආ) 2006 වර්ෂයේ පුද්ගලික ආයතනයකට ලබාදුන් රු.40,000ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඇ) වර්ෂ 3කට වැඩි කාලයක සිට ආයතනය වෙත තැන්පත් කර ඇති පුස්තකාල තැන්පතු රු.1,782,088ක් අදාල පාර්ශවයන් වෙත ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඈ) 2007 වර්ෂයේ සිට සේවයෙන් ඉවත් වී ගිය සේවකයන්ගේ රු.86,647ක් වූ ණය ඇපකරුවන්ගෙන් හෝ වෙනත් ආකාරයකින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

අ) මූල්‍ය ප්‍රකාශන වල වටිනාකම රු.5,000,000ක් ලෙස දක්වා ඇති ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා හිමිකම් ඔප්පුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ආ) ජාත්‍යන්තර ශාඛාවේ රු.2,911,912ක්වූ ලැබිය යුතු ගිණුම් හා රු.11,603,217ක්වූ ගෙවිය යුතු ගිණුම් සඳහා වයස් විශ්ලේෂණ සහිත උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකළ අතර ශේෂ තහවුරු කිරීම් කැඳවා නොතිබුණි. මේ වන විට ජාත්‍යන්තර ශාඛාවේ කටයුතු පිලිබඳ විමර්ශණයක් සිදුවෙමින් පවතින බව අධ්‍යක්ෂ දැනුම් දී ඇත.

ඇ) ජාත්‍යන්තර ශාඛාව වසා දැමීමේදී මෙරටට ආපසු ගෙනඑන ලද වත්කම් පිළිබඳව 2010 මැයි 04 දින නියෝජ්‍ය මූල්‍යාධිකාරී විසින් කරන ලද වත්කම් භෞතික හඳුනාගැනීම හා 2009 දෙසැම්බර් 31 දිනට වූ වත්කම් වල ශේෂපත්‍ර වටිනාකම අතර වෙනස රු.15,207,356ක්වූ අතර ඊට හේතු ඉදිරිපත් නොකෙරුණි.

ඈ) දේශීයව ආරම්භ කරන ලද ජාත්‍යන්තර ශාඛා කාර්යාලයේ සේවයට ජාත්‍යන්තර ශාඛාවේ සේවය කළ සේවකයින් දෙදෙනෙකු කළමණාකරණ මණ්ඩල අනුමැතිය යටතේ පරිපාලන කළමණාකරු හා යන්ත්‍ර ක්‍රියාකරු ලෙස 2010 ජුනි 14 දින සිට අනුයුක්ත කර තිබුණි. ඔවුන් සඳහා 2010 නොවැම්බර් වන විට රු.924,700ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. ඔවුන්ගේ පත්වීම් ලිපි, රාජකාරී පැවරීමේ ලිපි හා ඔවුන් ඉටුකරන ලද රාජකාරී කටයුතු පිලිබඳ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ඉ) ජාත්‍යන්තර ශාඛාවේ පැවැත් වූ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින්ගේ නාම ලේඛනයක් හෝ අයකළ පාඨමාලා ගාස්තු පිළිබඳ විස්තර අඩංගු ලේඛනයක් පවත්වා

නොතිබුණු අතර ලියාපදිංචි වූ ශිෂ්‍යයන් සහ තව දුරටත් අය විය යුතු පාඨමාලා ගාස්තු පිළිබඳව විස්තර ආයතනය සතුව නොතිබුණි.

### 1.2.6 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

පහත සඳහන් නීති,රීති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| අ) 1983 අංක 12 දරන පරිතෝෂිත පනත 20 වගන්තිය | 2010 වර්ෂය අවසානයේදී ආයතනයේ සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය වෙනුවෙන් පරිතෝෂිත දීමනා වෙන් කිරීම් රු.6,398,570ක් විය යුතු වුවත් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව එහි ශේෂය රු.6,289,197ක් විය. රු.109,373ක් වූ ශේෂයන් අතර වෙනසට හේතු වූයේ පරිතෝෂිත ගණනය සඳහා සැලකිල්ලට නොගත යුතු අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙනි. |
| ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 751 | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| ඇ) 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලිය | 2010 සැප්තැම්බර් සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවයට මුදාහල කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සේවකයින් දෙදෙනකු සඳහා 2010 වර්ෂය අවසාන වනවිට රු.366,712ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.59,078,631ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,773,078ක් ලෙස දක්වා තිබුණද එය රු.8,928,069ක් විය යුතුව තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය රු.50,150,562ක් විය. මෙම වර්ධනය සඳහා රු.3,687,520කින් ආයෝජන ආදායම, රු.1,046,760කන් ප්‍රකාශන අලෙවි ආදායම,

රු.33,896,755කින් පාඨමාලා ගාස්තු ආදායම වැඩිවීම හා ජාත්‍යන්තර ශාඛාවේ වියදම රු.75,294,561කින් අඩුවීම ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 2.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

අ) 2009 වර්ෂය දක්වා වෙනම ගිණුම් පිළියෙල කරන ලද ජාත්‍යන්තර ශාඛාව වසාදැමීමෙන් පසු එහි වූ වත්කම් හා වගකීම් නිසිලෙස හඳුනාගැනීමකින් හෝ සත්‍යාපනයක් මගින් තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රධාන කාර්යාලයේ ලෙජර් ගිණුම් වලට ගෙන තිබුණි.

ආ) ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනය, පවත්නා නීතිරීති රෙගුලාසි යටතේ සකස් කිරීමට, වත්කම් ලේඛන පැවැත්වීම නිලධාරීන්ට පුහුණු කිරීම හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම යන කාර්‍යයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.14.1 ඡේදයට පටහැනිව පුද්ගලයකු වෙත 2008 දෙසැම්බර් 20 දින රු.296,000කට පවරා දී තිබූ අතර අදාල ගෙවීම 2009 මාර්තු 30 දින සිදුකර තිබුණි. 2010 වර්ෂය සඳහාද ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර්ම හා භෞතික පරීක්ෂාව සඳහා රු.45,000ක මුදලක් 2011 අප්‍රේල් 05 දින අදාල පුද්ගලයා වෙත ගෙවා තිබුණි. මේ සඳහා දරන ලද වියදම පහත සඳහන් හේතූන් නිසා නිෂ්කාර්‍ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

   i. 2009 හා 2010 වර්ෂ වල අවසන් ගිණුම් වල සඳහන් වටිනාකම් අදාල ස්ථාවර වත්කම් ලේඛණයෙන් තහවුරු නොවීම.
   ii. අදාල නිලධාරීන් පුහුණු නොකිරීම.
   iii. ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් ගත නොකිරීම.

ඇ) වසා දැමුණු ජාත්‍යන්තර ශාඛාව වෙනුවෙන් ඩුබායිහි පවත්වාගෙන ගිය අංක 021-580683-001 දරන බැංකු ගිණුමේ, 2009 අගෝස්තු 31 දිනට වූ AED 3,000.31 ක්වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් දේශීය බැංකු ගිණුමට මාරුකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

ඈ) ජාත්‍යන්තර ශාඛාවේ MBA 2007 සහ MBA 2008 යන පශ්චාත් උපාධි පාඨමාලා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

### 2.2.2 අනාර්ථික ගණුදෙණු

----------------------

ජාත්‍යන්තර ශාඛාවේ භාණ්ඩ මෙරටට ගෙන්වීමේදී එම භාණ්ඩ නිශ්කාෂනය කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් රු. 244,264ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

### 2.2.3 නිසි අධිකාර් බලයක් නොමැති ගණුදෙණු

-------------------------------------------

අ) ජාත්‍යන්තර ශාඛාව මගින් පවත්වනු ලැබ සහතික පත්‍ර පාඨමාලා සඳහා කළමණාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව ගාස්තු තීරණය කර අය කර තිබුණි.

ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමෙන් තොරව වර්ග මීටර 900ක වාහන අංගනයක් ඉදිකිරීම සඳහා ආයතන 08කින් ලංසු කැඳවීම් කර අඩුම ලංසුකරු වෙත රු.1,339,600ක (වැට් රහිතව) මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම කොන්ත්‍රාත්තුව තවත් වර්ග මීටර 1000කින් වැඩි කර රු.2,881,400ක් (වැට් රහිතව) ගෙවා තිබුණි. මෙම වටිනාකම ආයතන ප්‍රසම්පාදන සීමාව ඉක්මවූවකි.

### 2.2.4 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------

ජාත්‍යන්තර ශාඛා කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල හිමි ආයතනය විසන් 2010 ජනවාරි 07 දිනැති AED 56,750ක් වූ ආපසු එවූ චෙක්පත හා පර්ශ්‍රයෙහි ඉතිරි කර පැමිණි AED 4,100 ක වටිනාකම ඇති වත්කම් පවරා ගැනීම සම්බන්ධයෙන් කුලී හිමියා විසින් එවන ලද 2009 අගෝස්තු 28 දිනැති ලිපිය හා එහි අන්තර්ගත කරුණු පහත සඳහන් හේතූන් නිසා ගැටළුකාරී විය.

අ) ලිපියේ දිනය 2009 අගෝස්තු 28 ලෙස සටහන් වුවද එම ලිපියේ 2010 ජනවාරි 07 දින ආපසු එවූ චෙක්පතක් පිළිබඳව සඳහන්ව තිබීම.

ආ) AED 56,750ක්වූ ආපසු එවූ චෙක්පත සම්බන්ධ තොරතුරු බැංකු ප්‍රකාශය, චෙක්පත් දින දීර්ග කිරීමේ ලේඛනය මගින් තහවුරු නොවීම.

ඇ) කාර්යාල කුලී ගෙවීමේ නිවැරදිතාවය සහ ගෙවියයුතු කුලීය පිළිබඳ තහවුරු කරගතහැකි ලිපිගොනු හා ලේඛණ ආයතනය විසින් පවත්වා ගෙන ගොස් නොතිබීම.

## 3. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

අ) ගිණුම්කරණය

ආ) ස්ථාවර වත්කම්

ඇ) දේශන ශාලා කුළියට දීම

ඈ) ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යාම

ඉ) භාණ්ඩ හා සේවා මිල දී ගැනීම

ඊ) පාඨමාලා අයදුම්පත් මුද්‍රණය සහ ආදායම් රැස් කිරීම